// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2337/11 – 2023 ජුනි මස 21 වැනි බදාදා – 2023.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2019/336.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.07.28 දිනැති හා අංක 2290/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2022.06.20 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහරගම, නාවින්න, පරණ පාර, අංක 111/6 බී හි පදිංචි වෛද්‍ය එස්. ආර්. යූ. විමලරත්න සහ සීදුව හි පිහිටි විජය කුමාරතුංග අනුස්මරණ රෝහල අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.05.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජුනි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය**
**බේරුම්කරු ඩී. එම්. එම්. බී. බක්මීවැව මැතිතුමා ඉදිරිපිටදීය.**

වෛද්‍ය එස්. ආර්. යූ. විමලරත්න මහතා
අංක 111/6 B, පරණ පාර,
නාවින්න, මහරගම.

*පළමුවැනි පාර්ශ්වය.*

*ආරාවුල් අංකය*: IR/COM/04/2019/336
බේරුම්කරණ අංකය: A/33/2022.
2023 පෙබරවාරි මස 28 වැනි දින දීය.

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල,
සීදූව.

*දෙවැනි පාර්ශ්වය.*

අතර පවතින කාර්මික ආරාවුල

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2022 ජූනි මස 20 මා පත් කර මා වෙත යොමු කර ඇත.

ඉහත පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ.

"වෛද්‍ය එස්. ආර්. යූ. විමලරත්න මහතා සීදූව විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂක ලෙස පත් කල 2018.06.05 සිට 2018.09.01 දක්වා වන කාලය සඳහා සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ MH/MS/WKMH/05/24/2017 අංක හා 2018.04.05 දිනැති ලිපියට අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2018 ප්‍රකාරව, දීමනා හිමි ද? හිමි වේ නම් එය නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද? යන්නත් පිළිබඳව වේ."

බේරුම්කරණය සඳහා මා වෙත පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත හා වාචික කරුණු සලකා බැලීමේ දී පහත කරුණු සඳහා විශේෂ අවධානය යොමු කරමින් බේරුම්කරණ ප්‍රදනය ඉදිරිපත් කරමි.

- වෛද්‍ය එස්. ආර්. යූ. විමලරත්න මහතා 2017.06.05 දින සිට 2018.06.04 දින දක්වා වන වසරක කාලයක් සඳහා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂ තනතුර සඳහා විධිමත් පත්වීමක් ලබා ඇති බව,
- ඔහුගේ වසරක කොන්ත්‍රාත් කාලය අවසානයේ දී තවත් මාස 03ක් සඳහා (2018.06.05 සිට 2018.09.01) සේවා දිගුවක් ලබාදීමට රෝහල් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එකඟත්වය පළ කරන ලද ඉල්ලීමක් සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය වෙත යොමු කරන ලදුව එම ඉල්ලීම පිළිගනිමින් අමාත්‍යාංශ ලේකම්වරයා විසින් වෛද්‍ය විමලරත්න මහතා නැවත සේවයේ යොදවන ලෙස දැනුම් දීම.
- අදළ දැනුම්දීම අනුව වෛද්‍ය විමලරත්න මහතා නැවත දීර්ඝ කරන කාලය තුල සිය රාජකාරි කටයුතු රෝහල වෙනුවෙන් ඉටු කිරීම.
- රජයේ විශ්‍රාමික නිලධාරින් නැවත සේවයේ යොදවා ගැනීමට අදාළව වැටුප් හා වෙනත් දීමනා සම්බන්ධ 3/2018 චක්‍රලේඛය 2018.02.01 දින සිට ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය මගින් දැනුම්දීම.
- වෛද්‍ය විමලරත්න මහතාගේ 2018.06.05 දින සිට 2018.09.01 දක්වා වන විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂක ලෙස කරන ලද සේවය වෙනුවෙන් ද 3/2018 චක්‍රලේඛය අනුව ගෙවීම් කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා විසින් රෝහල් පරිපාලනය දැනුවත් කර තිබේ.
- වෛද්‍ය එස්. අර්. යූ. විමලරත්න මහතා විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කළ 2018.06.01 සිට 2018.08.31 දින දක්වා වන කාලය සඳහා රුපියල් එක්ලක්ෂ පනස් දහක මුදලක් (150,000.00) වෛද්‍ය එස්. අර්. යූ. විමලරත්න මහතා වෙත ගෙවීමට කටයුතු කරන ලෙස විජය කුමාරතුංග අනුස්මරණ රෝහල වෙත නියෝග කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට මාස 02ක් ඇතුලත අදාළ මුදල ඉල්ලුම්කරුට ගෙවීම සඳහා මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු බවට වැඩිදුරටත් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදනයක් බව ප්‍රකාශ කරමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥ,
ඩී. එම්. එම්. බී. බක්මීවැව,
බේරුම්කරු.

2023 මැයි මස 02 වැනි දින,

EOG 06 - 0156

මගේ අංක - IR/COM/03/2020/187

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.08.08 දිනැති හා අංක 2292/06 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.07.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහනුවර, වට්ටාරන්තැන්න පැසේජ්, අංක 55 හි පදිංචි පී. ජී. එස්. වික්‍රමතුංග මයා සහ කොළඹ 07, වෝඩ් පෙදෙස, අංක 20 හි පිහිටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.05.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 ජුනි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

බේරුම්කරුඃ- ඩී. එම්. එම්. බී. බක්මීවැව මැතිතුමා ඉදිරියේ දී ය.

පී. ජී. එස්. වික්‍රමතුංග මයා,
අංක. 55,
වට්ටාරන්තැන්න පැසේජ්,
මහනුවර.

*(පළමු පාර්ශ්වය)*

ආරාවුල් අංකය: IR/COM/03/2020/187.
බේරුම්කරණ අංකය: A/37/2022.
2023 මාර්තු මස 07 වැනි දින දී ය

සහ

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,
අංක 20,
වෝඩ් පෙදෙස,
කොළඹ 07.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවත්නා කාර්මික ආරාවුල

<u>ප්‍රදානය</u>

කම්කරු හා විදේශ රැකියා ගරු අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2022 ජූලි මස 28 මා පත් කර මා වෙත යොමු කර ඇත.

<u>ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ</u>

පී. ජී. එස්. වික්‍රමතුංග මයාගේ සේවාරම්භක වැටුප් පියවර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 460 අනුව සකස් නොකිරීම තුළින් ඒ මහතාට අසාධරණයක් සිදු වී තිබේ ද? එසේ අසාධාරණයක් සිදුව තිබේ නම්, ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද? යන්නත් පිළිබඳව වේ.

බේරුම්කරණය සඳහා මා වෙත පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ලිඛිත හා වාචික කරුණු සලකා බැලීමේ දී පහත කරුණු සඳහා විශේෂ අවධානය යොමු කරමින් බේරුම්කරණ ප්‍රදානය ඉදිරිපත් කරමි.

- මෙහි පැමිණිලිකාර පී. ජී. එස්. වික්‍රමතුංග මයා 2002 පෙබරවාරි 25 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරි තනතුරට පත් කරන ලදී.
- එම තනතුරට අදාළ වැටුප් පරිමාණය රු. 14,180 - 10x375 - 17,930 ලෙස දැක්වේ.
- මෙම පත්වීම ලැබීමට පෙර ඔහු සේවය කළ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ සේවකයෙක් ලෙස ඔහු ලද මූලික වැටුප රු. 14,820 බවයි.
- විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛ අංක 460 අනුව 2002.03.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි පී. එස්. වික්‍රමතුංග මහතා විශ්වවිද්‍යාල කොමිෂන් සභාව මගින් රු. 16,100 ක මූලික වැටුපක පිහිටුවා ඇත.

පී. ජී. එස්. වික්‍රමතුංග මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යේෂ්ඨ සහකාර ලේඛකාධිකාරි තනතුරට පත්වීම ලබන විට ඔහු ලද මූලික වැටුප ඊට පෙර ඔහු සේවය කළ ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ දී අවසන් වශයෙන් (2002.03.07 වන විට) ඔහු ලද මූලික වැටුපට වඩා වැඩි වැටුපක් බැවින්, මෙම පත්වීම අනුව වැටුපෙහි පිහිටු වීමේ දී, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පී. ජී. එස්. වික්‍රමතුංග මහතාට අසාධාරණයක් කර නොමැති බැවින් ඔහු වෙත කිසිදු වන්දි මුදලක් හෝ වෙනත් දීමනාවක් ගෙවීම අනවශ්‍ය බව නිර්දේශ කරමි. මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

2023.05.02 දින

නීතිඥ,
ඩී. එම්. එම්. බී. බක්මීවැව,
බේරුම්කරු.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.